## පුත්තලම ප්‍රාදේශීය සභාව
## පුත්තලම දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජූලි 10 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පුත්තලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරියේ "පිළිසරු" ව්‍යාපෘතිය මඟින් ආධාර වශයෙන් ලබා දෙන ලද රු.499,991 ක් වූ කොම්පෝස්ට් හලන යන්ත්‍රයේ (Compost Sieving Machine) වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | කොම්පෝස්ට් හලන යන්ත්‍රය පරිත්‍යාග ලෙස 2018 ජූලි 20 දින ලැබුණද එහි වටිනාකම ඇතුලත් ගිවිසුම් පත්‍රය අප හට ලැබී ඇත්තේ 2019 පෙබරවාරි 12 දින බැවින් ගිණුම් ගත කිරීමට අවශ්‍ය තොරතුරු සහ වටිනාකම නොතිබූ නිසා ඊළඟ වර්ෂයේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරන බවට කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) ( | සභාවට අයත් නොවන පෙර පාසැල් ඉදිකිරීමට හා අළුත්වැඩියාවට ඉකුත් වර්ෂවල හා සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණු රු.3,799,149 ක් සභාවේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඊළඟ වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වලට ඉඩම් හා ගොඩනැගිලි ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කරන බවට කාරුණිකව දන්වා සිටිමි. |
| (iii) | සභාවේ පවත්වාගෙන යන ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් රු.908,800 ක් වටිනා ට්‍රැක්ටර් රථයක් හා ට්‍රේලරයක් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | සභා වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | පරීක්ෂා කර බලා අවශ්‍ය වේ නම් ඉදිරියේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

ආ) **නොසැසඳුනු ගිණුම්**

**---------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 ක උපයෝගි ලේඛන අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර නොසැසඳීම්වල එකතුව රු.22,157,667 ක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ශේෂවල වෙනස්කම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුලින් ගැලපීමට කටයුතු කරමි. |

(ඇ) **ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්** --

**--------------------------------**

**(i)** **ලැබියයුතු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 08 ක ශේෂවල එකතුව රු.10,481,602 ක් වූ අතර එයින් වර්ෂ 05 ක කාලයක් ඉක්මවූ ශේෂ එකතුව රු.6,198,102 ක් විය. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතුවේ. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |

**(ii)** **ගෙවියයුතු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් 07 ක එකතුව රු.29,856,032 ක් වූ අතර, එයින් වර්ෂ 05 ක කාලයක් ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.6,176,441 ක් විය. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී ණයහිමි ශේෂ තුල ඇති කපාහැරිය හැකි ණයහිමි ශේෂ කපාහැරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

(ඈ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

**----------------------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| එකතු වටිනාකම රු.196,556,787 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් විෂයයන් සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | අදාළ ලේඛන, ශේෂ සනාථ කිරීම්, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා ඔප්පු යාවත්කාලීනව නඩත්තු කරන බවත්, විගණනයට අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. |

1.4 අනුකූල නොවීම් -

## 1.4.1 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) 136 වගන්තිය | සභා සීමාව තුල පිහිටි සභාවට අයත් බදු දෙන ලද හෝ කුලියට දෙන ලද දේපළ සම්බන්ධයෙන් වූ වරිපනම් සහ අක්කර බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභා සීමාව තුල පිහිටි සභාවට අයත් බදු දෙන ලද හෝ කුලියට දෙන ලද දේපළ සම්බන්ධයෙන් වූ වරිපනම් සහ අක්කර බදු ආදායම් බිල්කර ඉදිරි වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) 150 (4) වගන්තිය | අය විය යුතු බදු මුදල් අයකර ගැනීමට ලේකම්වරයා කටයුතු කර නොතිබිණි. | පනතේ අදාළ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අයවිය යුතු බදු මුදල් අයකර ගැනිමට අධිකරණ කටයුතු සිදුකිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (iii) 158 වගන්තිය | වරිපනම් හා අක්කර බදු හිඟ මුදල් අයකර ගැනීම සඳහා එම බදු ගෙවිය යුතු අයගේ චංචල හා නිශ්චල දේපළ තහනමට ගෙන හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ අදාළ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේදී වරිපනම් හා අක්කර බදු හිඟ මුදල් ගෙවිය යුතු අයගේ චංචල හා නිශ්චල දේපළ තහනමට ගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) අංක 5 (7) රීතිය | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු වේ. | සියළු මූල්‍ය කටයුතු හා ගබඩා කටයුතු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් තුලින් පරීක්ෂා කරනු ලැබේ. ඉදිරියේදි පවතින අභ්‍යන්තර පාලන ක්‍රම වැඩිදියුණු කිරිමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | | |
|---|---|---|---|---|
| **(ii)** | අංක 33 රීතිය | වරිපනම් බදු ගෙවීම පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තුව අවසානයේදී පිළියෙල කර නොතිබුණි. | අදාළ රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වරිපනම් බදු ගෙවීම පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලයිස්තුවක් සහ දේපළ තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තු අවසානයේදී පිළියෙල කිරීමට 2019 වර්ෂයේ සිට කටයුතු කරමි. |
| **(iii)** | අංක 69 රීතිය | ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තියේ විධිවිධාන වලට අනුව වෙන්දේසි ඉඩම් සඳහා පී.එස්. 26C ආකෘතිය ප්‍රකාර ලේඛනයක් පවත්වා නොතිබුණි. | ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතු වේ. | ඉඩම් විකිණීම සඳහා පී.එස්.26C ආකෘතිය ප්‍රකාරව ලේඛනය සකසා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1 .** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.33,247,648 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,499,271 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම්, හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්ත මේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | - රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 1,284 | 1,343 | 1,130 | 2,306 | 1,284 | 1,272 | 3,121 | 2,194 |
| කුලී | 13,394 | 1,050 | 8,548 | 7,272 | 10,500 | 9,116 | 8,166 | 15,348 |
| බලපත්‍ර ගාස්තු | 4,301 | 4,589 | 4,589 | - | 5,001 | 3,749 | 3,749 | - |
| වෙනත් ආදායම් | 83,645 | 84,021 | 69,641 | 59,933 | 76,566 | 56,851 | 50,803 | 45,832 |
| එකතුව | 102,624 | 91,003 | 83,908 | 69,511 | 93,351 | 70,988 | 65,839 | 63,374 |

- ❖ රැස් කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායමෙන් කළ එකතු කිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් කළ එකතු කිරීම් ඇතුළත්ව තිබේ.
- ❖

**2.2.2** ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂයේ බිල් කිරීම් සමග ඉකුත් වර්ෂ වල හිඟ ආදායම්වලින් වරිපනම් , බදුකුලී හා වෙනත් ආදායම් පිළිවලින් සියයට 32 ක්, සියයට 52 ක්, හා සියයට 53 ක් පමණක් අයවී තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**2.2.3** වරිපනම් බදු

--------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | උපයෝගී ලේඛන වලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.1,659,510 ක් වූ අතර, එම හිඟයෙන් වර්ෂ 01ට වැඩි වර්ෂ 05 ට අඩු රු.489,213 ක්ද, වර්ෂ 05 ට වැඩි රු.791,645 ක්ද විය. තවද මුළු හිඟය තුල රු.10,000 ඉක්ම වූ ඒකක 26 කින් රු.464,393 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වේ. | හිඟ ශේෂය අයකර ගැනීම සඳහා මේ වන විට ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් සිදු කිරීම හා ආදායම් පරීක්ෂක නිලධාරී මහතුන් මගින් හිඟ අයකිරීම සිදු කරමින් පවතී. |
| (ආ) | වර්ෂ 05 කට වරක් ප්‍රධාන තක්සේරුවක් සිදු කළ යුතු වුවත් සභාව 2006 වර්ෂයෙන් පසුව 2018 වර්ෂය දක්වා ප්‍රධාන තක්සේරුවක් සිදුකර නොතිබුණි. | වරිපනම් තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වේ. | 2006 වසරේ සිදු කරන ලද තක්සේරුවෙන් පසු වරිපනම් තක්සේරු කටයුතු 2013 වසරේදී ආරම්භ කර ඇති අතර, විවිධ අවස්ථාවල ඇති වූ දුෂ්කරතා නිසා එම තක්සේරු කටයුතු මේ දක්වාම සිදුකළ අතර, මේ වනවිට වරිපනම් මිනුම් කටයුතු සිදුකර අවසන් වී ඇත. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් දේපළ තක්සේරු වාර්තා ලැබුණු පසු නව තක්සේරු වටිනාකම් වලට අදාළ වරිපනම් ගාස්තු අය කිරීමට කටයුතු කරමි. |

**2.2.4** අක්කර බදු

------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උපයෝගී ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමියන්ගෙන් රු.511,728 ක අක්කර බදු හිඟයක් වූ අතර, එම හිඟයෙන් රු.145,862 ක් අවුරුදු 05 කට වැඩි කාලයක්ද, රු.303,989 ක් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක සිට අයවීමට තිබූ ඒවා විය. | අයවිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතු අතර අදාළ සමීක්ෂණ සිදු කළ යුතු වේ. | මේ වන විට එම හිඟ ආදායම් අයකිරීමට කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දැනුම් දෙමි. |

**2.2.5** බදු කුලී හා කඩකුලී

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී රු.3,073,909 ක් විය. එයින් වර්ෂ 05කට වැඩි කඩ කුලී රු.49,625 ක්ද, වර්ෂ 01 ත් 05 ත් අතර රු.93,670 ක්ද විය. තවද නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 10 කින් රු.2,188,207 ක හිඟ කඩ කුලී ශේෂයක් විය. | හිඟ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාළ පුද්ගලයින් කඩ කුලී ගෙවීම් පැහැර හැර ඇත. මෙම කඩ කුලිය අඩු කර දෙන ලෙස ඉල්ලා ඇත. ඉදිරියේදී හිඟ කඩ කුලිය අය කරගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**2.2.6** උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලේඛනයට අනුව ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.28,348,827 ක් හා මුද්දර ගාස්තු රු.35,833,101 ක් විය. | අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතුවේ. | ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## 3 . මෙහෙයුම් සමාලෝචනය

## 3. 1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ

### (අ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සභාව ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබු අතර, පිළියෙල කර තිබු සංවර්ධන සැලැස්මේ ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර එහි ප්‍රගතිය ඉදිරිපත් කළ යුතු වේ. | 2018 වර්ෂය සඳහා සංවර්ධන සැලැස්මක් පුත්තලම ප්‍රාදේශීය සභාව පිළියෙල කර ඇත. ප්‍රගතිය ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

### (ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුත්තලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් දිනකට එකතුවන වෙන් නොකළ කසළ ට්‍රැක්ටර් ලෝඩ් 03 න් 01 ක් කොම්පෝස්ට් අංගනයටද, ඉතිරි ලෝඩ් 02 සභාවට අයත් විවෘත භූමියකටද, බැහැර කරනු ලබයි. කොම්පෝස්ට් අංගනයේ ගොඩනැගිලි ඉදිකිරීමට 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මධ්‍යම පරිසර අධිකාරියේ "පිළිසරු" ව්‍යාපෘතිය යටතේ මුදලින් රු.5,705,818ක්ද, රු.499,991ක් වටිනා හලන යන්ත්‍රයක්ද, ආධාර වශයෙන් ලැබී තිබුණි. එසේම සභා අරමුදලින් ගොඩනැගිලි ඉදිකිරීමට රු.2,547,181 ක්ද, අඹරන මැෂිමක් හා මෝටරයක් මිලදී ගැනීමට රු.111,385 ක්ද වැයකර තිබුණි. මෙම මැෂින් 2019 මැයි 20 වන විටත් නිශ්ක්‍රීයව තිබුණි. කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ සේවකයින් 05 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර පසුව ඉන් | විධිමත් කසළ කළමනාකරණ ක්‍රියාවලියක් සඳහා යොමු විය යුතු වේ. | ඝන අපද්‍රව්‍ය අංගනය වෙත දෛනිකව රැගෙන එනු ලබන දිරාපත් වන කසළ ට්‍රැක්ටර් ලෝඩ් 01 ක ප්‍රමාණය අංගනයේදි නැවත තේරීමකට ලක්කර අට්ටි වශයෙන් සකස් කිරීම 2017 අග භාගයේදී ආරම්භ කළ අතර එම කාලයේදී හලර් යන්ත්‍රයක්, කටර් යන්ත්‍රයක් ලැබුණි. නමුත් අංගනය පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට කි.මී.8 පමණ දුරිනි. එම ප්‍රදේශයේ ජලය ඉතා හිඟ භාවයක් පවතී. ජලය සපයාගැනීම ඉතාමත් දුෂ්කර බැවින් කොම්පෝස්ට් නිෂ්පාදනය ක්‍රමවත්ව සිදුකිරීමට නොහැකි වී ඇත. හලර් යන්ත්‍රය සඳහා තෙකලා විදුලිය ලබා ගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා 35m ක් වයර් මිලදී ගෙන එම යන්ත්‍රය සවිකිරීමට කටයුතු යොදා ඇති |

| | | |
|---|---|---|
| සේවකයින් තුන් දෙනෙකු වෙනත් රාජකාරීවල යොදවා තිබුණි. ඉතිරි සේවකයින් දෙදෙනාට හා සුපර්වයිසර්වරයාට කසළ අංගනයේ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් 2017 හා 2018 වර්ෂවල පිළිවෙලින් රු.242,687 ක් හා රු.1,135,844 ක්ද වශයෙන් එකතුව රු.1,378,631 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. තවද කොම්පෝස්ට් අංගනයේ විදුලිය හා ජල බිල්පත් සඳහා වර්ෂයකට රු.20,000 කට වඩා වැඩි මුදලක් වැයකර තිබුණු අතර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කර නොතිබුණි. | | බව කාරුණිකව දන්වමි. |

**(ඇ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක**

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| 2015 සිට 2030 අතර කාලය තුලදී තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේ මූලික පියවරයන් සභාව විසින් ආරම්භ කර තිබුණු අතර එහිදී හරිත කලාප සංවර්ධනය, රුක් රෝපණය, ස්වයං රැකියා වැඩසටහන්, කාන්තා අභිවෘද්ධි වැඩසටහන්, ළමා හා මාතෘ සායන, ආබාධිත පුද්ගලයින් හා දරුවන් සඳහා වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණය සහ ළමා අපචාර වැළැක්වීම අදාල මහජන යටිතල පහසුකම් කෙරෙහි අවධානය යොමුකර තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමට කටයුතු කළ යුතු වේ. | 2015 සිට 2030 අතර කාලය තුලදි තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේ මූලික පියවරයන් ලෙස කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම් යටතේ මංමාවත් සංවර්ධනය සහ වීථි පහන් ආලෝකකරණය, මහජන පොලවල් සහ වෙළඳ සංකීර්ණ පවත්වාගෙන යාම, ගුණාත්මක අධ්‍යාපනය යන අරමුණු යටතේ පූර්ව ළමා අධ්‍යාපන ආයතන පවත්වාගෙන යාම, විධිමත්කරණය සහ මහජන පුස්තකාල පවත්වාගෙන යාම, හරිත කලාප සංවර්ධනය, රුක් රෝපණය, ස්වයං රැකියා වැඩසටහන්, කාන්තා අභිවෘද්ධි වැඩසටහන්, ළමා හා මාතෘ සායන, ආබාධිත පුද්ගලයින් හා දරුවන් සඳහා වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණය සහ ළමා අපචාර වැළැක්වීම වැනි වැඩසටහන් කෙරෙහිද අවධානය යොමුකර ක්‍රියාත්මක කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 24 ක උප ලේඛනයක් ඉදිරිපත් කළ අතර ලිපිගොනු හා ලේඛන කිසිවක් සභාව සතු නොවුණි. අංක 1597/8 හා 2009 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව නියමිත පෙරසැරි ගාස්තු අයකර නොමැති බැවින් ඒවා අනවසර ඉදිකිරීම් ලෙස නිරීක්ෂණය විය. වාර්ෂික බලපත්‍ර ගාස්තුව කුළුණු ඉදිකළ සමාගමෙන් අයකර තිබුණද එම කුළුණු මගින් පහසුකම් සපයා තිබූ අනෙකුත් සන්නිවේදන සමාගම්වලින් වාර්ෂිකව වෙළඳ බලපත්‍ර ගාස්තුව අයකර නොතිබුණි. | ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතු අතර සභාවට ලැබිය යුතු ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධ තොරතුරු ඇතුලත් ලිපිගොනුවක් සභාවේ නොමැති බවත් සම්ප්‍රේෂණ කුළුණු වල සවිකර ඇති වෙනත් ආයතන වල දුරකථන සම්ප්‍රේෂණ උපාංග පිළිබඳ නිවැරදි තොරතුරු සභාව සතුව නොමැත. |
| (ආ) | 2018 වර්ෂය තුල සභා සතු දේපළ හා වෙළඳ අයිතීන් 14 ක් ටෙන්ඩර් නොවීම නිසා අවම ලංසුව වූ රු.1,132,796 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි. | සභා ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළ යුතුවේ | අදහස් දක්වා නොමැත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 102 ක් වූ අතර 108 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. ඒ අනුව අනියම්/ආදේශක තනතුරු 06 ක් අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව බඳවාගෙන තිබුණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අනියම්/ ආදේශක පදනම මත සේවකයින් 19 දෙනෙක් බඳවාගෙන ඇති අතර මේ සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගෙන ඇත. |

(ආ) සේවක ණය
--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පසුගිය වර්ෂවලදී සේවය හැර ගිය, වැඩ තහනමට ලක්වූ හා විශ්‍රාම ගිය සේවකයින් 10 දෙනෙකුගෙන් රු.273,774ක ශේෂයක් අයවිය යුතුව තිබුණි. එම ණය ශේෂ අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | සේවක ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සේවය හැර ගිය, විශ්‍රාම ගිය, සේවකයින් සඳහා ලබාදුන් අය නොවන සේවක ණය අයකර ගැනීමට ලිපි මගින් විවිධ අවස්ථාවල අදාළ නිලධාරීන් දැනුවත් කොට අයකරගෙන සහ අදාළ ඇපකරුවන්ගෙන්ද කොටසක් අයකරගෙන ඇති බවත් ඉතිරිය ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**
-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අක්කර 05, රූඩ් 02, පර්චස් 25.4ක් විශාල සෙලංගුනාඩු හෙවත් සීමාවෙල් නැමති ඉඩම කොටස් 51කින් යුත් කට්ටි සැලැස්මක් 2018 මාර්තු 09 දින අනුමත කර තිබුණි. සැලැස්මට අනුව රූඩ් 02, පර්චස් 05 ක් වූ අංක 29 දරන ඉඩම් කොටස පොදු පහසුකම් සඳහා වෙන්කර තිබුණද එය ඔප්පුවකින් ප්‍රාදේශීය සභාවට පවරාගෙන නොතිබුණි. | පොදු පහසුකම් සඳහා ඉඩම් කොටස සභාවට පවරා ගත යුතුවේ. | සභාවට මෙම ඉඩමෙන් ලැබිය යුතු ප්‍රමාණය ඔප්පුවකින් පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**3.5 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**
----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.165,500 ක් වටිනා ජල බවුසර් 02 ක් භාවිතයෙන් තොරව ප්‍රධාන කාර්යාල භූමියේ ගාල් කර තිබුණු අතර 2008 වර්ෂයට පෙර මිලදීගෙන තිබූ රු.540,360 ක් වූ යන්ත්‍රෝපකරණ තොගයක් නිශ්ක්‍රීයව පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | ජල බවුසර 02 සඳහා අංක රහිත වූ බැවින් එය ලබාගත් විගස වෙන්දේසි කරන බවත්, අනෙක් යන්ත්‍රෝපකරණ නිශ්චිතව හඳුනාගෙන වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

**3.6 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් ට්‍රැක්ටර් රථයක් සමාලෝචිත වර්ෂයේදී රු.766,700ක් වැය කර එන්ජිමේ සම්පූර්ණ අළුත්වැඩියාවක් කර තිබුණි. අළුත්වැඩියා කර මාස කිහිපයක් ගතවීමෙන් පසු නැවත එන්ජිමේ දෝෂයක් නිසා ධාවනයෙන් ඉවත් කර තිබුණි. මෙම අළුත්වැඩියාව සම්බන්ධයෙන් අදාල ගරාජය සමග ගිවිසුමකට එළඹ නොතිබූ අතර අළුත්වැඩියා කර සභාවට භාර දුන් දින සිට වසරක කාලයක් එන්ජිම සඳහා වගකීම් ලබාදීමට එකඟව ගරාජයෙන් ලිපියක් ලබාගෙන තිබුණු නමුත් එම වගකීම් කාලය තුල අමතර ගෙවීමකින් තොරව අළුත්වැඩියා කර ගැනීමට තිබූ අවස්ථාව සභාව අහිමි කරගෙන තිබුණි. අළුත්වැඩියා කිරීමේ බිල්පතට අනුව නව ස්ටියරින් වීල් එකකට ගෙවා තිබුණු නමුත් සවිකර තිබුණේ පැරණි එකකි. අනෙකුත් නව අමතර කොටස් සවිකිරීමෙන් පසු තීන්ත ආලේප කිරීමට පෙර යාන්ත්‍රික ඉංජිනේරුවරයා පරීක්ෂා කර නොතිබුණි. | වගකිවයුත්තන් හඳුනාගෙන ඉදිරි කටයුතු කළ යුතු වේ. | මෙම අළුත්වැඩියාව සම්බන්ධයෙන් ගිවිසුම්ගතවී නොමැති බව කාරුණිකව දැනුම් දෙමි. ගලවා ඉවත් කරන ලද අමතර කොටස් සභාවට භාරදී ඇති බව සඳහන් ලේඛන සොයා ගැනීමට නොමැති බව කාරුණිකව දැනුම් දෙමි. ස්ටියරින් වීල් එකක් සවිකිරිම පිළිබඳව බිල්පතේ සඳහන් වුවත් සවිකර ඇත්තේ පැරණි එකකි. |

**3.7 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩා පිටියක් ඉදිකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයකින් හා කොන්ත්‍රාත්කරුවෙකු ප්‍රසම්පාදනයෙන් බැහැරව තෝරාගෙන 2018 නොවැම්බර් 30 දින වන විට වැඩ ආරම්භ කර අත්තිවාරම් plinth beam දක්වා ඉටුකර තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර කොන්ත්‍රාත්කරුවන් තෝරා ගත යුතුවේ. | ඇස්තමේන්තු වටිනාකම රු.2,282,808 කි. මෙය සමාධි වැඩිහිටි සමිතිය සමග ගිවිසුම්ගතව වැඩ ඉටුකිරීමට කටයුතු යොදා ඇත. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ වෙසෙන මහජනතාවගේ සුභසාධනය වෙනුවෙන් වැය විෂයයන් 58කින් සේවා සැපයීමට වෙන්කර තිබූ රු.6,710,000 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර අදාළ සේවාවන් කිසිවක් සිදුවී නොතිබුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | සංවර්ධන සැලසුම් අනුව යම් යම් ව්‍යාපෘති සඳහා සභා මුදල් වැය නොවී වෙනත් ආයතන සහ අරමුදල් මගින් ප්‍රතිපාදන සලසාගෙන ව්‍යාපෘති සිදුකල නිසා සහා මුදල් වැය ශීර්ෂ වල ඉතිරි වී ඇති බවට පෙන්නුම් කරයි. අයවැය ඇස්තමේන්තු පරිදි ප්‍රාග්ධන ලැබීම් සහ අනෙකුත් ලැබීම් ප්‍රමාණාත්මක නොවීම සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය නොලැබීම, වැනි හේතු නිසා ව්‍යාපෘති සැලසුම් කල පරිදි සිදුකිරීමට නොහැකි විය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය තව දුරටත් ශක්තිමත් කර අභ්‍යන්තර විගණන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වේ. | සියළු මූල්‍ය මෙහෙයුම් කටයුතු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් තුලින් පරීක්ෂා කරනු ලැබේ. ඉදිරියේදි පවතින අභ්‍යන්තර පාලන ක්‍රම වැඩිදියුණු කිරිමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |